**ජාතික ක්‍රීඩා අරමුදල - 2020**
**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය
**--------------------------------**

ජාතික ක්‍රීඩා අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
**---------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ කොරියාවේ පැවැත්වෙන ලෝක ශූරතා මේස පන්දු තරඟාවලියට සහභාගි වීම සඳහා ශ්‍රී ලංකා මේස පන්දු සංගමය වෙත ලබාදීමට නියමිතව තිබූ රු.2,000,000 ක් කොරෝනා වසංගත තත්ත්වය මත එම තරඟාවලිය දින නියමයක් නොමැතිව කල්ගත වීම හේතුවෙන් එම මුදල ක්‍රීඩා අරමුදලට ආපසු බැර කිරීමට කටයුතු කිරීමේදී, මෙම වියදම මූල්‍ය ප්‍රකාශනවල ජාත්‍යන්තර තරඟාවලි වියදම් වලින් ඉවත් නොකර චෙක්පත අවලංගු කිරීම අනුග්‍රාහක ආදායම් ලෙස වෙනත් ආදායම් වලට ඇතුලත් කර තිබුණි. මෙම ගනුදෙනුව නිවැරදිව ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ජාත්‍යන්තර තරඟාවලි වියදම රු.2,000,000 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර වෙනත් ආදායම්ද රු.2,000,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | එම රු.මිලියන 2 වියදම සඳහා චෙක්පත අවලංගු කර අදාල වියදම් විෂයට බැර කිරීම සිදු කල යුතු වුවත් එය අතපසු වීමකින් අනුග්‍රාහක ලැබීමක් ලෙස සටහන් කර ඇති බව පිළිගනිමි. නමුත් මේ හේතුව නිසා මූල්‍ය ප්‍රකාශණ වල සමස්ත ප්‍රතිඵලයට බලපෑමක් සිදු නොවී ඇති අතර ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන පරිදි කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වීම. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 570 | තැන්පත් කළ දින සිට වර්ෂ 2 ක් තුල හිමිකම් ඉල්ලුම් නොකළ රු.10,000 ක් බැගින් වූ රු.120,000 ක් අගය වූ කල් ඉකුත් වූ තැන්පතු 12 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | 2019.11.19 දිනට අවුරුදු දෙකක කාලයක් ඉකුත් වු තැන්පතු පිළිබඳව මු.රෙ. 571 විධිවිධාන අනුව ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. | මුදල් රෙගුලාසි 570 අනුව කටයුතු කළයුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 79,788,742 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 6,495,404 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.73,293,338 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අරමුදලේ ආදායම රු.28,363,693 කින් අඩුවීම හා වියදම රු.44,929,644 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවලට ධෛර්ය දීම ,ඒවා වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා බිම් මට්ටමෙන් ක්‍රීඩාව සංවර්ධනය කිරීම ආරම්භ කල යුතු බැවින් ප්‍රාදේශීය වශයෙන් ක්‍රීඩාව නඟා සිටුවීම අත්‍යාවශ්‍ය වන අතර ඒ අනුව ,ප්‍රාදේශීය වශයෙන් ක්‍රීඩාව ඉදිරියට ගෙන යාම සඳහා දායකත්වය සපයනු ලබන සංවිධාන, පාර්ශය සහ පුද්ගලයන් වෙතද අනුග්‍රහය ලබාදීම සංගමයේ අරමුණ වුවද, ඒ සඳහා මෙතෙක් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම සහ ඒ අනුව ලබා දුන් අරමුදල් ක්‍රීඩාවේ දියුණුව සඳහා ප්‍රමාණවත් පරිදි දායකත්වයක් සිදුවන්නේද යන්න නිශ්චිතව පරීක්ෂා කර බැලීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය. | පෙන්වා දී ඇති නිරීක්ෂණ සම්බන්ධයෙන් අවධානය යොමු කරණ ලද අතර ක්‍රීඩා අරමුදලින් අනුග්‍රාහයක් ලබා දීමේදී අනුගමනය කලයුතු ක්‍රියාමාර්ග පිළිබඳ ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරමින් පවතින අතර මෙම අනුග්‍රාහයන් ලබා දීම මත ක්‍රීඩාවේ දියුණුවට සිදුවන දායකත්වය පිළිබඳවද පරික්ෂා කිරීමට කටයුතු කරන බවද දන්වා සිටිමි. | ක්‍රීඩා අරමුදලේ අපේක්ෂිත කාර්යසාධනය ලඟා කරගැනීම පිළිබඳ පරික්ෂා කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස්කළ යුතුවීම. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මාතර කඹුරුපිටිය බොක්ෂිං ක්‍රීඩාගාරය සඳහා ගොඩනැගිල්ලක් සකස් කිරීම සහ කඹුරුපිටිය වොලිබෝල් ක්‍රීඩා පිටිය සංවර්ධනයට අදාළ මුළු ඉදිකිරීම් කටයුතු සඳහා රු.9,157,993 ක්වූ ඇස්තමේන්තුගත මුළු මුදල මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණි. මුදල් ලබාදීමට ප්‍රථම ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් ශක්‍යතා වාර්තා, ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා, ක්‍රීඩා සමාජයේ සිටින සාමාජිකයින් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලබාගෙන නොතිබුණු අතර, වැඩ අවසන් වීමෙන් පසු ඉතිරි වූ රු.2,538,933 ක් ක්‍රීඩා අරමුදල වෙත ආපසු ලබාගැනීමට 2021 දෙසැම්බර් 31 දින වන විට කටයුතු කර නොතිබුණි | මෙම කරුණු සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ඉංජිනේරු මහතුන් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර ඇති අතර ඔවුන්ගේ වාර්තාව ලද පසු මේ සඳහා විස්තරාත්මක පිළිතුරක් ඉදිරිපත් කරමි. | ක්‍රීඩා සංවර්ධන කටයුතු සඳහා අරමුදල් යෙදවීමේදී නියමිත ශක්‍යතා වාර්තා, ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා ආදී තොරතුරු ලබා ගෙන ආයෝජනයේ ඵලදායකත්වය පිළිබඳ සැහීමකට පත්විය යුතු වන අතර, සංවර්ධන කාර්යයන් සඳහා වැයවන නිවැරදි අරමුදල් ප්‍රමාණය තීරණය කිරීමෙන් පසු ගෙවීම් කටයුතු සිදු කිරීම හා ඉතිරි මුදල් අරමුදල වෙත අප්‍රමාදව ලබාගැනීමට කටයුතු කළ යුතු වීම. |